## 2020 ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මැතිවරණයට තරඟ කරන අපේක්ෂයන්ට සහ දේශපාලන පක්ෂවලට ස්ත්‍රීන් විසින් ඉදිරිපත් කරන ස්ත්‍රීන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය

**ප්‍රකාශනය**

ස්ත්‍රීන් වන අපි, සියලු මානව අයිතිවාසිකම් අගයන සහ ඒවා ආරක්ෂා කරන, ප්‍රවර්ධනය කරන සහ ඒවා ඉෂ්ට කරන, සියලු මනුෂ්‍යයන්ට වෙනස් කොට සැලකීමකින් තොරව සමාන ලෙස සළකනු ලබන, සදාචාරාත්මක දේශපාලන සංස්කෘතියක් සහිත ප්‍රජාතන්ත්‍රවාදී සහ සාධාරණ සමාජයක් වෙනුවෙන් කැපවන්නෙමු.

එමෙන්ම, සෑම කෙනෙකුටම නිදහස්ව, පීඩාවක් නැතිව, ගරුත්වයක් ඇතිව ජීවත්විය හැකි, තමන් කැමති රැකියාවක් තෝරා ගැනීමට, ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් හා අධ්‍යාපනයක් ලබාගැනීමට, සුදුසු නිවසක් වෙත ප්‍රවේශවීමට, හිංසනයෙන් තොර අභිමානයෙන් ජීවත්විය හැකි වටිනාකම් හා වගවීම අගයන සමාජයක් සහ රාජ්‍යයක් තුළ ජීවත්වීමට අපි උත්සාහ කරමු.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය නිසා සමාජය තුළ පවතින ගතානුගතික අර්ථනිරූපනයන් මගින් ඓතිහාසිකව ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් සීමා කර ඇති අතර, ස්ත්‍රී පුරුෂ භූමිකාවන් ද ස්ත්‍රීන්ට හානිකර, ප්‍රතිරූපගත කිරීම් නියම කර ඇති බව අවධාරණය කරන්නෙමු.

ස්ත්‍රීන් සහ ඓතිහාසිකව කොන් කරනු ලැබූ අනෙකුත් ප්‍රජාවන්ට යුක්තිය වෙත ප්‍රවේශවීමට සහ අධිකරණ පද්ධතිය තුළ සාධාරණව සළකනු ලැබීමට හිමිකමක් ඇත. එසේම, සියලු සේවා ස්ථාන ආරක්ෂිතව සහ සියලු කණ්ඩායම් සහභාගී කරවා ගතහැකි පරිසරයක් විය යුතුය. රජය, මෙම මූලධර්මය පිළිගත යුතුවා මෙන්ම එය පිළිගැනීමට පුද්ගලික අංශයට ද බල කළ යුතුය.

**අපගේ ඉල්ලීම්**
**දේශපාලන ආයතන සහ භාවිතයන් :**

1 අමාත්‍ය මණ්ඩල සංඛ්‍යාව 20 නොඉක්මවන බවට සහ එම අමාත්‍ය මණ්ඩලයෙන් අවම වශයෙන් 25%ක් ස්ත්‍රීන්ගෙන් සමන්විත විය යුතු බව සහතික කිරීමට කැපවීම.

2 මනාප ඡන්ද ක්‍රමය අහෝසි කර කේවළ ක්‍රමයේ සහ සමානුපාතික නියෝජන ක්‍රමයේ සංයෝගයක් මත පදනම් වූ නව මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දීමට කැපවීම.

3 තීරණ ගැනීමේ වගකීම් සහිතව, තීරණ ගැනීමේ ව්‍යුහයන් තුළ පාර්ලිමේන්තුව, පළාත් සභා, පළාත් පාලන ආයතන සහ රාජ්‍ය ආයතන තුළ ස්ත්‍රීන්ගේ නියෝජනය 25%ක අවමයක් තිබිය යුතු බවට තාවකාලික විශේෂ විධි විධාන සැළසීමට සහතික වීම..

4 පළාත්පාලන ආයතනවල ස්ත්‍රීන් සඳහා නීතියෙන් වෙන්කර ඇති 25% කෝටාව ආරක්ෂා කර, දීර්ඝ කිරීමට කැප වී කටයුතු කිරීම.

5 මන්ත්‍රීවරුන් පක්ෂ මාරු කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන හඳුන්වා දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පත්වීම් අවලංගු කිරීමේ අයිතිය පුරවැසියන්ට ලබා දීමට කටයුතු කිරීමට කැපවීම.

6 සියලු පිළිගත් දේශපාලන පක්ෂවල ප්‍රධාන තීරණ ගැනීමේ ව්‍යුහයන්හි අනිවාර්යයෙන්ම අවම වශයෙන් ස්ත්‍රීන් 25% ක් සිටිය යුතු බවට අවශ්‍ය නෛතික ප්‍රතිපාදන හඳුන්වා දීමට කැපවීම.

7 අනාගත පරපුර තුළ ප්‍රගතිශීලී චින්තනයක් ඇති කිරීම සඳහා සාමය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය යන සංකල්ප සියලු ජාතික අධ්‍යාපන විෂය මාලා තුළට අන්තර්ගත කර කිරීමට කැපවීම.

8 සියලුම ජාතික මට්ටමේ දත්ත, ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන්කොට දැක්වීමට කටයුතු කිරීමට සහතික වීම.

9 වයසට යාම ස්ත්‍රීකරණයවීම හඳුනා ගැනීම (ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනයෙන් බහුතරයක් කාන්තාවන්ගෙන් සමන්විත වනු ඇති බව), නිවාස, සෞඛ්‍ය, ජීවනෝපායන් සහ ප්‍රවාහනය ඇතුළු ඔවුන්ගේ විශේෂිත ගැටළු විසඳීමට පියවර ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා කැපවීම.

10 බලපෑමට ලක්වූ ජනතාව අතර යුක්තිය සහ විශ්වාසය ගොඩනැගීම සඳහා සංක්‍රාන්ති යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණය ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කිරීමට කැපවීම.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ**

11 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන ව්‍යවස්ථා සංශෝධනයේ විධිවිධාන ආරක්ෂා කිරීමට කැපවීම.

12 19වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කර ඇති සියලුම ස්වාධීන කොමිසන් සභා සඳහා පත්වීම් සිදුකිරීමේ දී ස්ත්‍රී පුරුෂභාවය තුළනය වන ආකාරයට කටයුතු කිරීමට කැපවීම.

13 19වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ස්ථාපිත කර ඇති ස්වාධීන කොමිසන් සභා යටතේ ස්වාධීන ජාතික ස්ත්‍රී කොමිසමන් සභාවත් ස්ථාපිත කිරීමට අවශ්‍ය නීති සම්පාදනය ඉක්මන් කිරීමට කැපවීම.

14 මහජන අදහස් විමසීමේ කමිටුව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනු කමිටු විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශ සැලකිල්ලට ගනිමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව හරහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමය යළි ආරම්භ කිරීමට පියවර ගැනීම.

**මෙම ක්‍රියාදාමයේදී:**

15 ඓතිහාසික වශයෙන් ස්ත්‍රීන් කොන් කිරීමට සහ වෙනස්කොට සැළකීමට භාජනය වී ඇති බව පිළිගත යුතු ය. මේ හේතුව නිසාම විශේෂ වූ අයිතිවාසිකම් පනතක් ස්ත්‍රීන් සඳහා අවශ්‍ය වේ. තමන්ගේ ශරීරය පිළිබඳව තීන්දු ගැනීමට තමන්ට ඇති අයිතිය, ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සම්බන්ධව ඇති අයිතිය, ප්‍රචණ්ඩත්වයෙන් තොරව ගෞරවයෙන් යුතු ජීවිතයක් ගත කිරීමට ඇති අයිතිය, සහ ප්‍රචණ්ඩත්වය නිසා අගතියට පත් වූවන්ට ඵලදායි පිළියම් සහ සහන/වන්දි ලබාගැනීමට ඇති අයිතිය පිළිබඳව ආදී වූ අයිතිවාසිකම් එයට අන්තර්ගත කිරීමට කටයුතු කිරීම.

16. ව්‍යවස්ථාදායකය විසින් අනුමත නීතිවල පශ්චාත් තත්ත්වය පිළිබඳ ආණ්ඩු ක්‍රම ව්‍යස්ථානුකුලත්වය වලංගුභාවයේ නිශ්චයභාවය ඉවත් කිරීම පිළිබඳ අධිකරණමය සමාලෝචනය සක්‍රීය කිරීමට කැපවීම.

17. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වන වගන්තිය අහෝසි කිරීමට කැපවීම.



Women and Media Collective
Established 1984

18 ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අනන්‍යතාවය තේරුම් ගැනීමට පහසුවන

පරිදි ප්‍රත්‍යක්ෂ ප්‍රභේද හඳුන්වාදීම, වෙනස්කොට නොසැලකීමේ වගන්තියට අනුකූලව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12වැනි ව්‍යවස්ථාවේ අන්තර්ගතව තිබියදීත්, ඉහති කී කරුණු පිළිබඳ ආරක්ෂිත විධිවිධාන සහතික කිරීම සහ ඓතිහාසිකව හා අඛණ්ඩව පවතින වෙනස්කොට සැලකීම හඳුනාගැනීමට කටයුතු කිරීම.

19 ජීවත්වීමේ අයිතිය මූලික අයිතිවාසිකමක් වශයෙන් හඳුනාගත යුතු ය.

20 ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් මූලික අයිතිවාසිකම් ලෙස පිළිගෙන ඒවා අධිකරණයකදී විනිශ්චය කළහැකි විෂයයක් බවට පත් කිරීමට කැපවීම.

21 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගෙන ඇති සමානාත්මතාවය, ව්‍යවස්ථාව උල්ලංඝණය නොවන ආකාරයට රාජ්‍ය නොවන පාර්ශවයන්ගේ වගකීම් පිළිගැනීමට සහතිකවීම.

## මානව අයිතිවාසිකම් සහ නීති ප්‍රතිසංස්කරණ

22 අධිකරණයේ ස්වාධීනත්වය සහතික කිරීමට කැපවීම.

23 සමානාත්මතාවය සහ වෙනස් කොට නොසැලකීම පිළිබඳ ව්‍යවස්ථාමය බැඳීම් ඉටු කිරීම සහ ආබාධිත පුද්ගලයින් ඇතුළු සියලු පුද්ගලයින්ගේ සමාජ ආර්ථික හා දේශපාලන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා විශේෂ ක්‍රියාමාර්ග හඳුන්වා දීම සහතික කිරීමට කැපවීම.

24 සියලුම ආගමික පූජකවරුන් ඇතුළුව සියලුම පුරවැසියන්ට නීතිය සමානව ක්‍රියාත්මක කරන බවට සහතික වීම.

25 මානව හිමිකම් සහ වෙනස්කොට නොසැලකීම රාජ්‍ය ව්‍යුහයන්හි මූලික පදනම විය යුතුය. සියලු නීති ප්‍රතිපත්ති රාජ්‍ය ව්‍යුහයන්හි මූලික පදනම විය යුතු ය.

## අයිතිවාසිකම් සහ නීති ප්‍රතිසංස්කරණ

26 ශ්‍රී ලංකාව අපරානුමත (අනුමත) කර ඇති ''කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් තුරන් කිරීමේ සම්මුතිය'' (CEDAW) ඇතුලු සියලුම ජාත්‍යන්තර ප්‍රඥප්තීන්, දේශීය නීති පද්ධතියට ඇතුළත් කිරීම හා ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම්වලට අදාල වන ආකාරයට පවත්නා නීති සංශෝධනය කිරීමට කැපවිය යුතුය.

27 සංහිඳියා යාන්ත්‍රණය සඳහා වන උපදේශන කමිටුව සහ කාර්යය සාධක බලකාය විසින් 2017 වසරේ ඉදිරිපත් කරන ලද නිර්දේශ ප්‍රගතිශීලී අකාරයෙන් ක්‍රියාත්මක කිරීමට කැපවිය යුතුය.

28 සත්‍යය, සාධාරණත්වය, ප්‍රතිසන්ධානය සහ නැවත සිදුනොවීම සඳහා වන කොමිසම ස්ථාපිත කිරීමට කැපවිය යුතු වේ.

29 දේපල අයිතියට, පරිහරණයට සහ කළමනාකරණය කිරීමට සමාන අයිතියක් ස්ත්‍රීන්ට තිබිය යුතුය. එම අයිතීන් ස්ත්‍රීන්ට සමානව භුක්ති විඳීමට හිමිකමක් නොමැති දැනට බලාත්මක අසාධාරණ නීති (විශේෂයෙන් තේසවලමේ නීතිය සහ ඉඩම් සංවර්ධන ආඥා පනත) සංශෝධනය හෝ පුලුල් කර සමාන අයිතිය තහවුරු කිරීමට කැපවිය යුතුය.

30 නව පාර්ලිමේන්තුව පත් වී මාස 6ක් ඇතුළත, මුස්ලිම් ස්ත්‍රීන්ගේ ඉල්ලීම් පූර්ණ ලෙස සාක්ෂාත් කරගැනීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් සමග පූර්ණ එකඟතාවය සහතික කරමින් 1951 මුස්ලිම් විවාහ හා දික්කසාද පනත සංශෝධනය කිරීමට කැපවිය යුතුය.

31 දේශපාලන ජීවිතය තුළ කාන්තාවන්ට අත්විඳීමට සිදු වන ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට දණ්ඩ නීති සංග්‍රහය සහ අදාල මැතිවරණ නීති සංශෝධනය කිරීමට කැපවිය යුතුය.

32 ඉහත සඳහන් කළ නීති සංශෝධන සහ මානව හිමිකම් ආරක්ෂණය පිළිබඳ මහජන අධ්‍යාපනය සහ දැනුවත් කිරීම් සඳහා රජයේ ප්‍රමුඛ අවධානය යොමු කිරීමට කැපවිය යුතුය.

33 ත්‍රස්තවාදයට එරෙහි පනත සම්පූර්ණයෙන් අහෝසි කිරීම සහ දැනට සාකච්ඡා වෙමින් පවතින ප්‍රතිත්‍රස්ත පනත් කෙටුම්පත නීතිගත නොකිරීමට කැපවී රටේ සාමාන්‍ය නීතිය පමණක් භාවිතා කරමින් සුරක්ෂිතභාවය තහවුරු කිරීමට කැපවිය යුතුය.

34 රැස්වීමට ඇති නිදහස හා විසම්මුතිය ආරක්ෂා වන ආකාරයට, රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සමාජ සංවිධානවලට ස්වාධීනව ක්‍රියාත්මකවීමට ඉඩ ලැබෙන පරිදි ස්වේච්ඡා සමාජ සේවා ආඥා පනත(VSSO) සංශෝධනය කිරීමට කැපවීය යුතු ය.

35 අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රමය සාධාරණ හා යුක්තිසහගත ලෙස ක්‍රියාත්මක වන බවටත් දේශපාලන හේතුන් මත අපයෝජනයට ලක් නොවන බවටත් එහි සේවය ලබාගැනීමට ප්‍රවේශ කරන සියලු දෙනාගේ අයිතිවාසිකම් උල්ලංඝනය නොවන බවටත් සහතිකවීමට කැපවීම.

**තොරතුරු සහ වෛරී ප්‍රකාශ**

36 සංස්කෘතික බහුත්වවාදයට වැඩි වටිනාකමක් ලබා දී ඒ මගින් ජාතික ඒකාබද්ධතාවය තහවුරු කිරීම. මේ සඳහා ජාතික ප්‍රතිපත්තියක් ස්ථාපනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට කැපවීම.

37 වෛරී ප්‍රකාශනවලට ප්‍රතිකර්මයක් ලෙසින් මහජන අධ්‍යාපනය සහ ප්‍රතිපණිවුඩ සැකසීමේ සහ නිකුත් කිරීමේ ක්‍රියාවලියක් දියත් කිරීමට කැපවීම.

38 සියලුම අපරාධකරුවන් ඔවුන්ගේ සමාජ-දේශපාලනික හා ආගමික තත්ත්වය නොසලකා ප්‍රචණ්ඩත්වයට පොළඹවීම් කරන අවස්ථාවලදී දඬුවම් ලබාදිය යුතුය.

39 රාජ්‍ය අංශය ද ඇතුළත්ව ධාරිතා වර්ධනය හා මහජන අධ්‍යාපනය තුළින් තොරතුරු දැනගැනීමේ අයිතියෙහි (RTI) ක්‍රියා පටිපාටින් සහ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම කිරීමට කැපවීම.

**භාෂාව සහ සංස්කෘතිය**

40 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පූර්ණව ක්‍රියාත්මක කර රාජ්‍ය අංශයේ අනුකූලතාව සහතික කිරීමට කැපවීම.

41 උපායමාර්ග සහ සංස්කෘතිය පිළිබඳ නව ජාතික ප්‍රතිපත්තිය ඇතුළුව ප්‍රතිපත්ති, අධ්‍යාපනය සහ භාවිතාවන් මගින් ජාතික ඒකාබද්ධතාව ප්‍රවර්ධනය පිණිස සංස්කෘතික බහුත්වවාදය වඩා වැඩියෙන් අගය කිරීම සහතික කිරීමට කැපවීම.

42 ඉහත කාරණාවලට අමතරව, සංස්කෘතිය හරහා සියලු පුරවැසියන්ගේ මානව හිමිකම් උල්ලංඝනය නොකරන බවට වග බලා ගත යුතු ය.

**සංවර්ධනය, සම්ප්‍රදායික ජීවනෝපාය සහ පාරිසරික යුක්තිය**

43 සියලු සංවර්ධන ප්‍රතිපත්ති සැකැසීමේ දී සියලුදෙනාම ඇතුලත් කරගන්නා බවට සහ සමාජ ආර්ථික තත්ත්වය, වාර්ගිකත්වය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ආබාධිතබව, වයස සහ එවැනි වෙනත් කරුණු නොතකා සියලු ප්‍රජාවන්ට ප්‍රතිලාභ ගෙනෙන බවට සහතික කළයුතු ය.

44 ස්ත්‍රීකරණයවීම නිසා ඇතිවන දරිද්‍රතාවය හඳුනා ගැනීමත්, දරිද්‍රතාවයෙන් පීඩා විඳින ස්ත්‍රීන්ගේ ගැටළු ආමන්ත්‍රණය කරන විශේෂ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට කැපවීම.

45 තිරසාර කෘෂිකර්මාන්තය හා පාරිසරික කළමනාකරණය සඳහා ස්ත්‍රීන්ගේ දායකත්වය හඳුනා ගැනීමත්, ස්ත්‍රීන් සඳහා ඉඩම් භුක්තිය සහ වෙනත් ආර්ථික සම්පත් ළඟා කරදීම සහතික කිරීමත් ඇතුළුව මෙම අංශයේ ඔවුන්ගේ කාර්යභාරය ආරක්ෂා කිරීමට පියවර ගැනීමට කැපවීම.

46 සංවර්ධන ව්‍යාපෘතිවල මූලික සංකල්පීය අවස්ථාවේදී පාරිසරික ඇගයීම් වාර්තා අනිවාර්ය කළයුතු ය.

47 නියඟය, ලැව් ගින්න, ගංවතුර, නායයෑම් සහ මුහුදු ඛාදනය වැනි දේශගුණික විපර්යාස හේතුවෙන් සිදුවන විවිධ ආපදා හා අනතුරු අවම කිරීම පිණිස ආරක්ෂිත විධිවිධාන යෙදීම සහ පාරිසරික අභියෝගයන්ට මුහුණ දීම පිණිස යාවත්කාලීන ආපදා කළමනාකරණ ප්‍රතිපත්තියක් තවදුරටත් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම කළ යුතු ය.

48 දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම් වැළැක්වීම සහ අවම කිරීම සඳහා ක්ෂණිකව ස්ථාවර පියවර ගැනීම සහ ඒ සඳහා සම්පත් වෙන්කිරීමට කටයුතු කිරීම.

49 ගොවීන් සහ ගෙවිලියන්ගේ විශ්‍රාම වැටුප් වැඩිකිරීම සහ ගොවි ණය කපාහරමින් ඔවුන් දිරිමත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

50 වඩාත් අනුකලනාත්මක ප්‍රතිපත්ති හා සම්පත් තුළින් කාන්තාවන්ගේ සාම්ප්‍රදායික ජීවනෝපායන් සඳහා සහාය වීම සඳහා කැපවීම.

51 සමාගම් විසින් බීජ ඒකාධිකාරයක් අත්පත් කරගැනීමට කරන කටයුතු වළක්වා, සම්ප්‍රදායික බීජ වර්ග භාවිතය ව්‍යාප්ත කිරීමට රාජ්‍ය මැදිහත්වීම හා සහයෝගය වැඩි කළයුතු ය.

52 වන වගාව විනාශ නොකිරීම සහතික කරන, සංවේදී පාරිසරික පද්ධති සංරක්ෂණය කිරීමට කැපවීම.

53 කිසිදු සීමා කිරීමකින් තොරව සියලු පාරිසරික නීති ක්‍රියාත්මක කරනු ලබන බව සහතික කර උල්ලංඝනය කිරීම්වලදී දුර්විපාක නොලබා සිටීම අවසන් කළයුතු ය.

54 ජෛවස්කන්ධ බලය, සුළං බලය, සූර්ය ශක්තිය, සහ සමුද්‍ර ශක්තිය වැනි පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර සංවර්ධන කිරීම සහ ෆොසිල ඉන්ධන මත රඳා පැවැත්ම අඩුකිරීම මගින් බලශක්ති සුරක්ෂිතතාව සහතික කළයුතු ය.

**ශ්‍රමය සහ වැඩ**

55 ජාතික ශ්‍රම බලකා සමීක්ෂණවලදී සහ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම සඳහා කරනු ලබන ඇගයීම් වල දී, වැටුප් නොලබා සුරැකුම් සේවයේ නියුතු වූවන්ගේ වැඩ ඇගයීමකට ලක්වන ආකාරයට ඇතුළත් කිරීමට කටයුතු කිරීම.

56 ක්ෂුද්‍ර මූල්‍ය හා ක්ෂුද්‍ර ණය ආයතන ඵලදායී ලෙස අධීක්ෂණය හා නියාමනය කිරීම සඳහා දැඩි නීති සහ රෙගුලාසි හඳුන්වා දීම සහ බලාත්මක කිරීමට කටයුතු කිරීම.

57 වැඩ ලෝකය තුළ සිදුවන ලිංගික හිංසනය වැළැක්වීම පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 190 සම්මුතිය අපරානුමත කිරීමට කටයුතු කිරීම.

58 ගෘහස්ථ සේවකයන් සඳහා වන සුනිසි රැකියා පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ C189 සම්මුතිය අපරානුමත කිරීමට කැපවීම.

59 විදේශ රැකියා සඳහා විගමණය වීමට කාන්තාවන්ට ඇති අයිතිය සීමා කරන දැනට පවතින සියලු වෙනස් කොට සැලකීමේ රෙගුලාසි ඉවත් කිරීමට සහතික වීම..

60 වෙනස් කොට සැලකීමේ නීති පරිච්ඡින්න කිරීම මගින් ස්වකීය රැකියා තෝරා ගැනීමට කාන්තාවන්ට හැකියාව ලබා දී තෝරාගත් රැකියාව කුමක් වුවත්, නීතියෙන් ඔවුනට හිමි සියලු ආරක්ෂාවන් ලබා දීමට කැපවීම.

61 කාන්තා සහ පිරිමි විගමණික සේවකයන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීමට කැපවීම.

62 සියළුම පුරවැසියන්ට ලැබෙන පරිදි විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීමටත් මෙය ජීවන වියදම් දර්ශකයට සම්බන්ධ කිරීමටත් සහතික කිරීමට කැපවීම.

## ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ ලිංගික හා ප්‍රජණන සෞඛ්‍යය සහ අයිතිවාසිකම්

63 ලිංගික ප්‍රචණ්ඩත්වයට මුහුණුදුන් ස්ත්‍රීන්ට යුක්තිය ඉටු කර ගත හැකි බව සහතික කිරීම සඳහා වන නීති සම්පාදනයේ දී ලිංගික බලහත්කාරකම පිළිබඳ නීතිමය අර්ථ දැක්වීම් පුළුල් කිරීම (විවාහය තුළ ලිංගික බලහත්කාරකම ඇතුළත් කිරීම), වධහිංසා පැමිණවීම (ලිංගික ප්‍රචණ්ඩත්වය ඇතුළත් කිරීම) ඇතුළත් කිරීම, ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ අර්ථ දැක්වීම්වලට තාක්ෂණය හා සම්බන්ධ ප්‍රචණ්ඩත්වය ඇතුළත් විය යුතුය.

64 දඬුවම් නියම කිරීම්වල පුළුල් අර්ථ දැක්වීම් පිළිබිඹු කළ යුතු අතර කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ දී ලිංගික බලහත්කාරකම හා ලිංගික ප්‍රචණ්ඩත්වය සඳහා අත්හිටවූ සිරදඬුවම් තහනම් කළ යුතුය.

65 සියලු ප්‍රජාවන්හි සියලු තරුණ ස්ත්‍රීන් ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණ නීතියෙන් සමානව ආරක්ෂා කරනු ලැබීම තහවුරු කළ යුතුය.

66 අවශ්‍ය අවස්ථාවන්හිදී නීති සංශෝධනය කිරීම සහ ලිංගික ප්‍රචණ්ඩත්වයට මුහුණුදුන් තැනැත්තාගේ/වින්දිතයාගේ සාක්ෂිය කේන්ද්‍රගත වන සහ ස්වාධීන තහවුරු කිරීමක් අවශ්‍ය නොවන සාක්ෂි රැස් කිරීමේ ප්‍රමිතිගත භාවිතයන් හඳුන්වා දීම.

67 ලිංගික බලහත්කාරකම හා ලිංගික ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ස්වාධීන සනාථ කිරීමේ භාවිතය අහෝසි කරනු ලැබීමට සහතිකවීම.

68 නව පාර්ලිමේන්තුව පත් වී මාස 6 ක් ඇතුළත, 2005 සම්මත කරගත් ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනත ඉදිරියට ගෙනයාම සඳහා නීතිගත කිරීමේ සංශෝධිත කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.


Women and Media Collective
Established 1984

69 දණ්ඩ නීති සංග්‍රහයේ 303 වන වගන්තිය අහෝසි කර, සියලු දෙනාටම ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය සත්කාර හැසිරීම් සඳහා ප්‍රවේශවීමේ මාර්ග ශක්තිමත් කිරීම.

70 සහමතිය දෙන වැඩිහිටියන් අතර පුද්ගලිකව සිදු කරන පෞද්ගලික සම ලිංගික හැසිරීම අපරාධයක් බවට පත්කරන දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365 අ වගන්ති පරිච්ඡින්න කිරීමට කැපවීම.

71 සංක්‍රාන්ති ලිංගික පුද්ගලයින්ට එරෙහි වෙනස්කොට සැළකීම භාවිතා කළ නොහැකි ආකාරයට නීත්‍යානුකූල කිරීම සඳහා 'ව්‍යාජ ලෙස පෙනී සිට වංචා කිරීම' යන්න සංශෝධනය කිරීම; පොලිස්පතිවරයා විසින් ස්ත්‍රී පුරුෂ භාවය තහවුරු කරන සහතිකයේ වලංගුභාවය අනුමත කළ යුතු අතර මෙය වලංගු යැයි සලකා සියලු පොලිස් නිලධාරීන්ට නියෝග නිකුත් කළ යුතුය.

72 අල්ලස් පනත සංශෝධනය කර බලහත්කාරයෙන් ලිංගික අල්ලස් ගැනීමේ ක්‍රියාව එයට ඇතුළත් කිරීමට කටයුතු කිරීම.

73 අයාල ආඥාපනත සංශෝධනය කිරීමට කටයුතු කිරීම.

74 ස්ත්‍රීන්ට බලපාන සියළුම ප්‍රතිපත්ති සහ ව්‍යවස්ථාදායක මැදිහත්වීම් පදනම් විය යුත්තේ ස්ත්‍රීන් ජීවත් වූ යථාර්ථයන් පිළිබිඹු කරන එකතු කරන ලද සාක්ෂි මත ය.

75 ගුරු පුහුණුව ඇතුළුව සියලුම අධ්‍යාපන විෂයමාලාවලට අනිවාර්ය අංගයක් ලෙස වයසට ගැළපෙන සවිස්තරාත්මක ලිංගිකත්වය සහ ප්‍රජනක සෞඛ්‍ය අධ්‍යාපනය ඇතුළත් කිරීමට කැපවීම.

**ආයතන සහ ප්‍රතිපත්තිය**

76 කුමන රජයක් බලයට පත් වුව ද අධිකරණයේ ස්වාධීනත්වයට බාධා නොවන නීති ප්‍රතිපාදන සැළසුම් කිරීමට කැපවීම.

77 නීතිපති කාර්යාලය ආයතන දෙකක් ලෙස වෙන් කර රජයට එරෙහි වන නඩු ඇතුළු සියලු නඩු පැවරීම්වල කර්තව්‍යය භාර ගැනීමට රජයේ නඩු පැවරීමේ අධ්‍යක්ෂ මණ්ඩලයක් හඳුන්වා දීම.

78 සෑම පුරවැසියෙකුටම යුක්තිය වෙත ප්‍රවේශ වීමේ අයිතිය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති අතර එම අයිතිවාසිකම් උල්ලංඝනය වීමේ දී වින්දිත පක්ෂයට සාධාරණයක් ඉටු කර ගැනීමට සඵල සහ කාලීන ප්‍රතිකර්ම මෙන්ම සහන ඇති බව සනාථ කරමින් එම අයිතිය විනිශ්චය විෂයයක් කිරීමට කැපවීම.

79 ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ විමර්ශන සහ නඩු පැවරීම උපරිම වශයෙන් වසරක කාලයක් දක්වා කෙටි කළ යුතු ය. ඒ සඳහා ප්‍රමාණවත් පරිදි මානව සහ භෞතික සම්පත් යෙදවීමට කැපවීම.

80 ස්ත්‍රීන්ට එරෙහි සියළු ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ විමර්ශන කටයුතු සඳහා දැනුමෙන් සන්නද්ධ ක්‍රියාකාරිණියක් පත් කළ යුතු අතර ජාතික ක්‍රියාකාරී සැළසුම් පිළිබඳ පුළුල් සමාලෝචනයක් කිරීම හා ක්‍රියාත්මක කිරීම එක් මෙවලමක් යටතට ඒකාබද්ධ කිරීමට කැපවීම.



Women and Media Collective
Established 1984

81 සෑම පොලිස් ස්ථානයකටම අවශ්‍ය පරිදි දේශීය භාෂා දෙකක් පිළිබඳව මනා දැනුමක් ඇති ප්‍රමාණවත් පුහුණුවක් ලත් නිලධාරීන්ගෙන් සමන්විත සම්පත් සහිත කාන්තා හා ළමා කාර්යාංශ පිහිටුවීම සහ එම කාර්යාංශ දවසේ පැය 24 පුරා මෙම සේවාව සිදු කිරීමට පොලීසියට නියෝග කළයුතු ය.

82 කාන්තා ගෘහ මූලික පවුල් සඳහා හිංසාවෙන්, පීඩාවෙන් තොර ගරුත්වය රැකෙන පරිසරයක් නිර්මාණය වන පරිදි ඔවුන්ගේ ආර්ථික, සමාජ සුභසාධන ප්‍රතිලාභ වර්ධනය වන ලෙස ප්‍රතිපත්ති සැළසුම් කිරීමට කැපවීම.

83 මාතෘ හා ළමා සෞඛ්‍ය රක්ෂණය සඳහා අයවැයෙන් වෙන් කරනු ලබන මූල්‍ය ප්‍රතිපාදන 3% දක්වා වැඩි කිරීමට කැපවීම.

කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය
සහාය දක්වන ලදී

**අනුමත කිරීම: කාන්තා ප්‍රකාශනය 2019**

**සංවිධාන**

1. කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය (WMC)
2. විලූනු
3. කාන්තා සම්පත් මධ්‍යස්ථානය
4. ග්‍රාමීය කාන්තා පෙරමුණ
5. කාන්තා සංවර්ධන මධ්‍යස්ථානය
6. කාන්තා සහයෝගිතා පෙරමුණ
7. රුහුණු සිසිල
8. ඩබිඳු සාමූහිකය
9. කාන්තා දේශපාලන ඇකඩමිය
10. ඊක්වල් ග්‍රවුන්ඩ් (Equal Ground)
11. මානව උන්නතිය සංවිධානය (HEO)
12. පර්යේෂණ හා සවිබල ගැන්වීම සඳහා ඉස්ලාමීය කාන්තා සංගමය (IWARE)
13. කාන්තා මූලික නිවාස සඳහා අමරා දිස්ත්‍රික් සංගමය - යාපනය, කිලිනොච්චි, මුලතිව්, මන්නාරම, ත්‍රිකුණාමලය, මඩකලපුව සහ පුත්තලම
14. සංක්‍රමණික සේවකයින් සඳහා වූ ක්‍රියාකාරී ජාලය (ACTFORM)
15. කාන්තා අධ්‍යාපන හා පර්යේෂණ කේන්ද්‍රය (WERC)
16. ජනවාර්ගික අධ්‍යයන සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICES)

**පුද්ගලයින්**

1. මහාචාර්ය කමිනා ගුණරත්න
2. ආචාර්ය සේපාලි කෝට්ටෙගොඩ
3. ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්
4. වෛද්‍ය තිලෝමා මුනසිංහ
5. කුමුදිනි සැමුවෙල්
6. ඇන්බේරියා හනීෆා
7. චන්ද්‍රා ජයරත්න
8. මාරියෝ ගෝමස්
9. ක්ෂාමා රණවන
10. වේලායුදන් ජයචිත්‍රා
11. නෙලුන් ක්‍රිසන්ති ගුණසේකර
12. වේලුසාමි වීරසිංහම්
13. ජයන්ති කුරු-උතුම්පාල
14. රයිසා වික්‍රමතුංග
15. හනා ඉබ්‍රාහිම්
16. ආරණ්‍යා රාජසිංහම්
17. නිල්මිණි රේණුකා
18. චාන්දනී පුෂ්පලතා
19. බී. පී. ලියනගේ
20. ආර්.කේ. ප්‍රියදර්ශිණී
21. ආර්. මනිෂලිනි
22. එස්. ධර්ශිකා
23. කේ. සෞම්‍යා
24. ඩබ්ලිව්.එම්.සී. පුෂ්පලතා
25. ජේ. මෙට්ලික්මාරි
26. පී. ලෝගේස්වරි
27. ඊ.එම්. නිල්මිනි රේණුකා දමයන්ති
28. තිලකා වීරකෝන්

29. කේ. චලනි කාජයංගනි
30. ඒ. ෂම්දි රසංගිකා
31. කුසුම් අමරසිංහ
32. ශාස්ති කරුණරත්න
33. ඊ.ජී. අමරා
34. ශ්‍රියානි පතිරාජ
35. ඊ.එම්. ඉන්ද්‍රා අයිරාංගනි
36. නිසංසලා ගමගේ
37. රන්මලී ආනන්දගොඩ
38. එම්.එච්. නස්මියා
39. ඩබ්ලිව්.එච්. මනීෂා
40. ඩබ්ලිව්.එම්. සමන්ති විජරත්න
41. ආර්.ඩී.ජී. රාජපක්ෂ
42. ඉනෝකා එදිරිසිංහ
43. ඩබ්ලිව්.ඒ.සී. කුමාරි
44. ආර්.ඩී.ඩී.එස්. ආර්. ප්‍රනාන්දු
45. සුමිකා පෙරේරා
46. සන්ධ්‍යා එක්නැලිගොඩ
47. සීතා රංජනී
48. මෛත්‍රෙයි රාජසිංහම්
49. ශිරානි මිල්ස්
50. උදා දේශප්‍රිය
51. ලීලා රසූල්
52. එස්. මරියරාසලි
53. සුභා විජේසිරිවර්ධන
54. තරංගා දසිල්වා
55. එඩ්නා මල්කාන්ති
56. ස්ටෙලා පිලිප්
57. ඉනෝකා ප්‍රියදර්ශණී
58. කිමයා ද සිල්වා
59. සැන්ච්යා බ්‍රවුන්
60. එච්. ඉන්දුමදි
61. වසන්තන් සුමති
62. සිංගරා සාසරන්ජා
63. මාකෙන්තිරන් නිර්මලා
64. පාස්කරන් රාජී
65. සිවතුරෙයි කුලමන්කලම්
66. සිවරාසා මරියරිසාරි
67. කන්දයියා තුර්කා
68. ස්කන්ධරාසා සන්තිරවන්තනි
69. පී.සරෝජා
70. ශ්‍රීකාන්තරාසා සුසීකා
71. පී. අම්පිකායි
72. එස්. ලස්සුමිරානි
73. වී. කාර්තිකා
74. ඒ. තවරාණි
75. ඊ. සයිලා
76. පී. රත්නේශ්වරි
77. එන්. තිලකරාණි
78. නවරත්නම් අලකේශ්වරී
79. කනලින්කම් ලකවන්ති
80. වරතරාසා යෝගරාණී
81. වෛතිංකම් නවරන්සිතමනි
82. විජරත්නම් අලයිරරාසායි
83. මාකේෂ්වරන් වනිතා
84. මයිකාල් ජෝනි ජෙසිත්‍රා
85. ඊ. කන්මනියම්මා
86. එම්.එන්. ඉමූනිජා
87. එන් මිරේකා
88. එන්. නිරීජා
89. අයිසඋම්මා
90. පත්තිල සවාස්රීර්
91. කේ. අස්විනි
92. කේ. නිලානි
93. කේ. ජීවසාලිනි
94. කේ. රූබිනි
95. එස්. සුදර්සිනි
96. එස්. අන්පුරාණි
97. එස්. නිරීජා
98. ටී. සාන්තා
99. එස්. කයිරාල
100. එස්. ජෙන්කම්මා
101. එන්.එන්. පෙඩ්සුයා
102. රාමේශ්වරී
103. කේ. චන්ද්‍රා
104. වයලා පෙරේරා
105. වනමලී කෞෂල්‍යා ගලප්පත්ති
106. නෙලීකා රාජපක්ෂ